# උත්තර භාරතයේ සහ ශ්‍රී ලංකාවේ ඇඳුම්-පැළඳුම් අතර පවත්නා සම්බන්ධතාව

*රණසිංහ, ආර්. ඒ. එස්. ෂෙහාන්* [1]

ආදි මානවයා විවිධ පාරිසරික තත්ත්වයන්වලට මුහුණ දීමටත්, විළි වසා ගැනීම සඳහාත් ඇඳුම් ඇඳීමට පෙළඹුනි. ඒ අනුව ක්‍රම ක්‍රමයෙන් එය මිනිසාගේ මූලික අවශ්‍යතාවයක් බවට පත් විය. භූගෝලීය, දේශගුණික, සංස්කෘතික තත්ත්වයන්ගේ බලපෑම් මත විවිධ ප්‍රදේශයෙන් ප්‍රදේශයට ආවේණික වූ ඇඳුම්)පැළඳුම් දක්නට ලැබේ. භාරතය යනු බහු ජාතික, බහු සංස්කෘතික, බහු ආගමික පසුබිමකට හිමිකම් කියන්නා වූ දේශයකි. භූගෝලීය වශයෙන් විශාල ප්‍රදේශයක පැතිර ඇති භාරතය තුළ ප්‍රාන්ත වශයෙන් විවිධ විෂමතා දැකිය හැකිය. මෙහි බලපෑම මත ඇඳුම්)පැළඳුම්ද නිර්මාණය විය. අතීතයේ පටන් ශ්‍රී ලංකාව හා භාරතය අතර සමීප සම්බන්ධතාවක් පැවතුණි. ආර්යයන්ගේ පැමිණීමෙන් පසු විවාහ සඳහා කුමරියන් ගෙන්වා ගැනීම, විවිධ සංක්‍රමණ, මහින්දාගමනය සහ වාණිජ ගනුදෙනු ආදිය මෙයට හේතු විය. මෙම සබඳතා ලාංකේය සංස්කෘතිය සකස් වීමටද බලපෑවේය. සංස්කෘතිය විදහා දක්වන ප්‍රධාන අංගයක් ලෙස ඇඳුම්-පැළඳුම්වල මෙම සමානතාව දක්නට ලැබෙයි. මෙම අධ්‍යයනයේදී දෙරටෙහි ප්‍රචලිත කාන්තා ආභරණ හා කාන්තා-පිරිමි ඇඳුම්-පැළඳුම්, පාවහන් යනාදියෙහි බොහෝ සමානකම් ඇති බව ප්‍රත්‍යක්ෂ විය. මේ සඳහා අන්තර්ජාලය, පොත්පත් සඟරා ආදිය භාවිතා කර ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ උත්තර භාරතයේ සහ ලංකාවේ පවත්නා ඇඳුම්-පැළඳුම් පිළිබඳ තුලනාත්මක විග්‍රහයක යෙදීමයි.

**ප්‍රමුඛ පදඃ** ඇඳුම්-පැළඳුම්, සංස්කෘතිය, ශ්‍රී ලංකාව, උත්තර භාරතය

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*shehan.ranasinghe1993@gmail.com*